කොළඹ 07, විජේරාම පාරේ නිවසක තනිව ජීවත් වූ බවට පැවසෙන 75 හැවිරිදි සංගීත ගුරුවරියකට ලිංගික අපරාධයක් සිදු කර, ඝාතනය කිරීමේ සිදුවීමක් මාධ්‍ය වාර්තා කර තිබිණි.

මේ සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනුණු සැකකරු විසින් සිදුකළ පාපොච්චාරණයේ කොටස්ද ඇතුළත්ව, සිදුවීම සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී දිනමිණ, අරුණ, සිළුමිණ, ඉරිදා මව්බිම, සති අග අරුණ පුවත් වාර්තාවන් (ජනවාරි 03, සහ ජනවාරි 07, 2024) තුළ, පැවසෙන ආකාරයට ලිංගික අපරාධයට සහ ඝාතනයට ලක් වූ කාන්තාව හැඳින්වී ඇති ආකාරය පහත පරිදි ඉදිරිපත් කළ හැක.

* වයස 75 වුණාට හරි ලස්සනයි", "මැඩම් වයස උනාට හරිම ලස්සනයි", "මැඩම් නයිටියක් ඇඳගෙන හිටියේ", "ඉටි රූපයක් වගේ ලස්සනයි", "මට මැඩම් ගැන ආශාවක් ඇති වුණා", "හැත්තෑ පස් වියැති වුවද ඇය හැඩකාර කාන්තාවක වුවාය", "ඇය එක්ක ලිංගිකව හැසිරෙන්න ආශාවක් ඇති වුණා", "නෝනා ඇඳන් හිටියේ නයිටි ගවුමක්", "නෝනට ආස හිතුණු", "75 කීවට වයස පේන්නේ නෑ".

ඔබට හැඟෙන ලෙසට,

1) මෙම පුවත් වාර්තාවන්හි දැක්වෙන පහතාකාරයේ කොටස් හැඟීම් කළඹවන සුළු (භාවාතිශය) නොවන්නේද? සිදුවූ බවට පැවසෙන ලිංගික අපරාධයක් වාර්තා කිරීම සඳහා හැඟීම් කළඹවන සුළු (භාවාතිශය) වාර්තාකරණයක් කෙතරම් උචිත ද?

2) විශේෂයෙන්ම, මෙවැනි අන්තර්ගතයන් ඔස්සේ, මියගිය අය ලිංගික වස්තුවක් ලෙසින් හැඟවුම්කරණය කිරීමක් සිදු නොවන්නේ යැයි අපට සහතික විය හැකිද?

3) මෙම කරුණු සමඟින් සමස්තයක් ලෙසින් ගත්විට, ලිංගික අපරාධයක් සහ ඝාතනයක් සම්බන්ධ මෙවැනි පුවත් වාර්තා කිරීමක් ඔබට පිළිගත හැකිද?

